**වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**

-----------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 25 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 ජුලි 15 දින හා විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 සැප්තැම්බර් 06 දින සභාපතිවරයා වෙත ඉදිරිපත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට වඩමාරච්චි නිරිත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**(අ)** මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට යොදාගත් **ගිණුම්කරණ ප්‍රතිපත්ති**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉදිරියේදි ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් නිෂ්චිත සංවර්ධන ආධාර මගින් රු.881,535ක වියදමින් ඉදිකළ සතිපොළ, ඉඩම් හා ගොඩනැගිලි ගිණුමේ ඇතුළත් නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශනවල ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම අඩුවෙන් දක්වා තිබුණි. | 2020 වර්ෂයේ අවසන් ගිණුම්වල ඇතුළත් කරනු ලැබේ. | සතිපොළ ගොඩනැගිල්ලෙහි වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි ගිණුමෙහි ඇතුළත් කිරීමට ක්‍රියාමාර්ග ගත යුතු වේ. |

## 1.4 අනුකූල නොවීම

-----------------

### 1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

------------------------------------------------------------------------

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මුල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | අදාළ පනත ප්‍රකාරව වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනත 158 (i) වගන්තිය | රු. 2,503,684ක හිඟ වරිපනම් බදු ගෙවීම පැහැර හැරී පුද්ගලයන්ට වරෙන්තු නිකුත් කර නොතිබුණි. | ඉදිරියේදි වරෙන්තු නිවේදන නිකුත් කිරීමට කටයුතු කරනු ලැබේ. | හිඟ වරිපනම් බදු සම්බන්ධයෙන් අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | රු.207,420ක්වූ කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් සභාව විසින් ගෙන නොතිබුණි. | කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. | නියමිත මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ චක්‍රලේඛය | | | |
| | 2018.01.24 දිනැති අංක 02/2018 දරන චක්‍රලේඛය | ප්‍රජාව/ප්‍රතිලාභීන් දැනගැනීමට පහසුවන අයුරින් මහජන සේවාවන් ලැයිස්තුව සකස්කර ප්‍රදර්ශනය කර නොතිබුණි. | සේවාවන් ලැයිස්තුව සංශෝධනය කර අළුතින් සකස් කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව මහජන සේවාවන් ලැයිස්තුව ප්‍රදර්ශනය කිරීමට ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ඉ) | අනෙකුත් චක්‍රලේඛ 2018.07.19 දිනැති අංක 2018/e පළාත්පාලන -01 දරන පළාත්පාලන චක්‍රලේඛය | ප්‍රජාවට අන්තර්ජාලය මාර්ගයෙන් සේවාවන් ලබාගැනීමේ පහසුකම් සලසා දී නොතිබුණි. | මේ සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛය ප්‍රකාරව අන්තර්ජාලය සේවාවන් සලසා දීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 154 වගන්තිය ප්‍රකාරව, අදාල ඇතැම් ඉඩම් විකුණුම්වලින් සියයට 01ක විකුණුම් බදු අයකළ යුතු වුවත් සභාව විසින් ඒවා අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අප ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ ක්‍රියාත්මක වන බැංකු සමග සම්බන්ධ වී ක්‍රියාමාර්ග ගනු ලැබේ. | ප්‍රාදේශීය සභා පනත ප්‍රකාරව, විකුණුම් බදු අයකිරීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |

## 2 මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 34,469,646ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 64,654,300 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2019 | | | 2018 | | |
|---|---|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 148,500 | 141,787 | 2,503,684 | 129,500 | 222,089 | 2,397,676 |
| කුලී | 16,336,850 | 15,540,722 | 2,343,730 | 15,598,396 | 16,524,871 | 2,361,520 |
| බලපත්‍ර ගාස්තු | 3,245,200 | 4,207,298 | - | 2,643,900 | 3,524,552 | - |
| වෙනත් ආදායම් | 106,996,230 | 85,885,992 | 8,818,133 | 99,015,714 | 111,154,424 | 50,088,159 |
| | 126,726,780 | 88,881,884 | 13,665,547 | 117,387,510 | 131,425,936 | 54,847,355 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු.131,425,936ක් වුවත්, 2019 වර්ෂයේ රැස් කළ ආදායම රු.105,775,799කින් වැඩිවී තිබුණි. මේ අනුව 2018 වර්ෂය සමග සැසීමේදී 2019 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.25,650,137කින් අඩුවී තිබුණි. | 2019 වර්ෂය සඳහා උසාවි දඩ මුදල් නොලැබී නිසා ආදායම් අඩුවීමත්, 2018 වර්ෂයේ කඩකාමර කුලියට දී කුලි මුදල් ලැබීම නිසාත් ආදායම් වැඩිවීමත් සිදුවී තිබුණි. | සභාවේ ආදායම් වැඩිකිරීමට සභාව විසින් කටයුතු කළ යුතු අතර බිල් කළ ආදායම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. |

**2.2.3 වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ හිඟ වරිපනම් බදු රු.2,503,684 ක් අයකර ගැනීම සඳහා සභාව විසින් කටයුතු කර නොතිබුණි. | දේපළ හඳුනාගෙන බදු අයකිරීමට නොහැකිව පවතී. | හිඟ හිටි මුදල් නියමිත කාලයේදී අයකර ගත යුතු වේ. |

**2.2.4 කුලී**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ හිඟ කඩ කුලී රු.274,475ක් අයකර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි. | නියමිත ක්‍රියාමාර්ග සිදු කර ඇත. | හිඟ කඩ කුලී අයකිරීමට සුදුසු කටයුතු සභාව විසින් ගත යුතු වේ. |

**2.2.5 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු**

**(අ) උසාවි දඩ මුදල්**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2019 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.5,549,496 ක් ලැබිය යුතුව තිබුණි. | උසාවි දඩ මුදල් ලබාගැනීමට කටයුතු කර ඇත. | හිඟ උසාවි දඩ මුදල් නියමිත කාලයේ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

(ආ) මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2019 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු රු.516,587 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කර ඇත. | හිඟ මුද්දර ගාස්තු නියමිත කාලයේ අයකර ගැනීමට කටයුතු කළ යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය ප්‍රකාරව, මහජන සෞඛ්‍යය, පොදු උපයෝගීතා සේවාවන් සහ පොදු මංමාවත්, මහජන සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පනවා තිබූ අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 30 ක් සම්බන්ධයෙන් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කර ඇත. | අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කිරීමට කටයුතු කළ යුතු වේ. |

(ආ) මූල්‍ය ප්‍රතිපාදන සලසා නොතිබීම

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාව විසින් සකස් කළ කොන්ත්‍රාත් කාර්යයන් සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රකාරව සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ රු. 31,300,000 ක් වටිනා කොන්ත්‍රාත් කාර්යයන් 31 ක් ක්‍රියාත්මක කළ නොහැකි විය. | සංවර්ධන වැඩසටහන් වෙන්කිරීම් යටතේත් එකතු කර ඇත. අයවැයෙහිත් ඇතුළත් කර ඇත. | නියමිත කාලයේ කොන්ත්‍රාත් කාර්යයන් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුවේ. |

(ඇ) අතහැර තිබූ ව්‍යාපෘති

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන අරමුදල් මගින් රු. 2,999,724 ක වියදමින් සම්පූර්ණ කර තිබූ මුදලෙයක්කුලි පානීය ජලය බෙදාහැරීමේ ව්‍යාපෘතිය වර්ෂ 03කට අධික කාලයක සිට ක්‍රියාත්මක කර නොතිබුණි. | අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට යෝජනාවන් ඉදිරිපත් කර ඇත. | අදාල වැඩසටහන ක්‍රියාත්මක කිරීමට උචිත ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතුවේ. |

(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (i) ඝන අපද්‍රව්‍ය වෙන්කිරීම් නොකර, රැස්කර තිබූ අතර බැහැර කරන ස්ථානවල දෛනිකව රැස්කරන කසල කැබලිකර පස්දමා වසා නොතිබුණි. | සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | සියළුම ප්‍රදේශවල රැස්කරන අපද්‍රව්‍ය සියල්ල වෙන්කර එකතු කළ යුතු වේ. |
| (ii) ඝන අපද්‍රව්‍ය කාර්යයන්වල යොදවනු ලබන සෞඛ්‍ය කම්කරුවන්ට යුතු වෛද්‍ය පරීක්ෂණයන් සභාව විසින් පවත්වා නොතිබුණි. | වෛද්‍ය පරීක්ෂණයන් සිදුවෙමින් පවතී. | සෞඛ්‍ය කම්කරුවන්ට වෛද්‍ය පරීක්ෂණයන් නියමිත කාලයේ සිදු කළ යුතු වේ. |

## 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) පළාත් පාලන සහකාර කොමසාරිස් වරයා විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් නොකිරීමෙන් ප්‍රදේශයට අදාල මූලික කාර්යයන් ඉටු කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇත. | පළාත් පාලන සහකාර කොමසාරිස් වරයා නියමිත වාර්තා නියමිත කාලයේ ඉදිරිපත් කළ යුතුවේ. |
| (ආ) සුසාන භූමි බදු අයකර ගැනීම සඳහා සභාව ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | සුසානභූමි මුරකරු තනතුර අනුමත කර නොතිබුණි. | සුසාන භූමි බදු අයකර ගැනීම සඳහා සභාව ක්‍රියාමාර්ග ගත යුතුවේ. |
| (ඇ) වර්ෂ 48කට අධික කාලයක සිට වරිපනම් බදු නැවත තක්සේරුකිරීමක් සිදුකිරීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | දේපළ නැවත තක්සේරු කිරීම සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන ඇත. | වරිපනම් බදු නැවත තක්සේරු කිරීමට නියමිත කාලය තුළ ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් විධිමත් අයුරින් මානව සම්පත් ලබාගෙන යොදවා නොතිබූ බැවින්, එවැනි මානව සම්පත් 20 ක් විසින් නිම කළයුතු සේවාවන් ප්‍රමාදවී තිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය. | ක්‍රියාමාර්ග ගෙන ඇත. | තනතුරු පුරප්පාඩු නියමිත කාලයේ පිරවීමට අවශ්‍ය කටයුතු කළ යුතු වේ. |

**3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1987 අංක 15 දරන සභා බල ප්‍රාදේශීය සභා පනතේ 134 වගනත්තියට අනුව 2019 වර්ෂයේ වරිපනම් බදු අයකිරීමට දේපල 12018 ක් සඳහා "K" ආකෘති පත්‍ර බෙදාහැර නොතිබුණි. | හිඟ මුදල් අයකිරිමට K ආකෘති පත්‍ර බෙදාහරිමින් පවති. | "K" ආකෘති පත්‍ර බෙදාහැරිමට අවශ්‍ය කටයුතු කළ යුතුය. |

**3.5 වත්කම් කළමනාකරණය**

**3.5.1 පවරා නොගත් වත්කම්**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාව විසින් භාවිතා කරනු ලබන වාහන 06ක් මේ දක්වා සභාවේ නමට අයිතිය මාරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අයිතිය පවරා ගැනීමට කටයුතු කරමින් පවති. | නියමිත කාලයේදි වාහනවල අයිතිය මාරු කිරීමට කටයුතු කළ යුතු වේ. |

**3.5.2 නිෂ්කාර්ය වත්කම්**

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පෙර පාසලේ ලී බඩු නඩත්තු කිරීමෙන් තොරව පැවතුණු අතර පසුගිය වර්ෂ 05 පුරාම එම පාසල ක්‍රියාත්මක නොවන තත්ත්වයේ පැවැතිණි. | වෙන්දේසියේ විකිණීමට කටයුතු කර ඇත. | පෙර පාසැලේ ලීබඩු භාවිතා කිරීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුවේ. |

## 3.6 ප්‍රසම්පාදන

------------

### 3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම

---------------------

| විගණන නිරීක්ෂණ | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රාදේශීය සභාව විසින් භාණ්ඩ හා සේවා ක්‍රියාවලිය සඳහා පිළියෙල කර තිබිය යුතුවේ. ඒසේ වුවත් සේවාවන් සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් මේ දක්වා සකස් කර නොතිබුණි. | ආරක්ෂක සේවාව සහ පවිත්‍රතා සේවාව වර්ෂය ආරම්භයේදීම ලබාගැනීම නිසා මේ සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමේ අවශ්‍යතාවයක් මතුනොවීය. | ප්‍රසම්පාදන සැලැස්ම අනුමත මාදිලියට අනුව නියමිත කාලයේ සකස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගතයුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

------------------------------------

### 4.1 අයවැය පාලනය

-----------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සභාවේ ඇස්තමේන්තුගත වියදම් සහ තථ්‍ය වියදම් අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරීක්ෂණය වූයෙන් මෙය ඵලදායි නොවූ අයවැයක් ලෙස අනාවරණය වි තිබුණි. | කාර්යමණ්ඩල පුරප්පාඩු 17ක් පැවැතීම නිසාත් ගමන් වියදම් සම්බන්ධ නිලධාරීන්ගේ ඉල්ලීම් ප්‍රමාණය අවම වීමත් සහ විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව විසින් ඉල්ලන ලද වට්නාකම අවම වීම නිසාත් තථ්‍ය වියදම්වල අඩුවීමක් සිදුවි තිබුණි. | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග සභාව විසින් ගත යුතු වේ. |